ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2025.09.29

01. මුත්තයියා කලා දර්ශනී මිය
අංක 250, වවුනිකුලම් අරම්කඩේ
අම්බාලපුරම්

විත්දිත පාර්ශවය

01. ස්ථානාධිපති
ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒ.පී.එස්. කුමාර ඇපලකොටුව මයා
පොලිස් ස්ථානය
මරදාන

02. පොලිස් පරීක්ෂක කේ.පී.එම්.ආර්.ඩී. සංජය කුමාර මයා
අපරාධ අංශ ස්ථානාධිපති
පොලිස් ස්ථානය
මරදාන

03. පොලිස් සැරයන් ඩබ්.පී.එස්.කේ. පද්මසිරි මයා,
පොලිස් ස්ථානය
මරදාන

04. කා.පො.කො. අංජලිකා සේනානි ගමගේ මිය
පොලිස් ස්ථානය
මරදාන

වගඋත්තරකරුවන්




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.

සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451

ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74

ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com

දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82

ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521

ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996

වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිලි අංකය : **HRC/SUO/MOTU/03/25**

පැමිණිල්ල

මරදාන පොලිස් ස්ථානයේ අත්අඩංගුවේ සිටි සැකකාරියක් වන මුත්තයියා කලා දර්ශනී (අංක 250, වවුනිකුලම් අරමකඩේ අම්බාලපුරම්හි පදිංචි) නැමැත්තිය 2025.01.22 වන දින ගෙල සිරවී රෝහල්ගත කිරීමෙන් පසු මිය යාමේ සිද්ධිය සම්බන්ධයෙන් මාධ්‍ය මඟින් පල කෙරුණු පුවත් මත පදනම්ව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්වයං මෙහෙයවීමෙන් පරීක්ෂණයක් ආරම්භ කර ඇත. එහිදී අදාළ වගඋත්තරකරුවන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීමට ක්‍රියාකර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම

1 වන වගඋත්තරකරු වන ප්‍ර.පො.ප. ඒ.ජී.එස්. කුමාර ඇපලකොටුව මහතා

පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2025/01/22 දින මරදාන පොලිස් ස්ථානය වෙත සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණ අවස්ථාවේදී පළමු වගඋත්තරකරු වන මරදාන පොලිසියේ ස්ථානාධිපති ප්‍ර.පො.ප ඇපලකොටුව ගමරාලගේ ශාන්ත කුමාර ඇපලකොටුව විසින් ප්‍රකාශයක් ලබා දෙමින් කරුණු දක්වා ඇත. එම ප්‍රකාශය අනුව තමා 2021.11.22 සිට මෙම සිදුවීම දක්වා මරදාන පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස සේවය කරන බවත් තමා තමාගේ නිල නිවස වන පොලිසිය පිටුපස නිවසේ රැඳී සිටින විට 2025/01/21 උදෑසන 5.00ට පමණ කාර්ය භාර නිලධාරි උ.පො.ප. ප්‍රේමචන්ද්‍ර නිලධාරියා විසින් තමාගේ රාජකාරි නිල ජංගම දුකථන අංකයට පොලිස් ස්ථානයේ දුරකථන අංකයෙන් ඇමතුමක් ලබා දී වරෙන්තුවක් සඳහා රැගෙනවිත් ඉදිරිපත් කර ඇති සැකකාරියක් සිරමැදිරියේ යකඩ දොරහි බෙල්ලෙන් එල්ලී ඇති බවට තමාට දැනුම් දුන් බවයි. ඒ අනුව තමා හැකි විගස නිල ඇඳුමින් සැරසී චෝදනාගාරයට වාර්තා කළ බවත් කාර්ය භාර නිලධාරි උ.පො.ප ප්‍රේමචන්ද්‍ර, උපසේවක පො.සැ 32924 පත්මසිරි හා මෙම සැකකාරිය භාරව සිටි කාන්තා පොලිස් කොස්තාපල් අංජලිකා නිලධාරිනිය යන නිලධාරීන් සමඟ එක්ව පරීක්ෂා කර බැලූ බවත් එම ස්ථානයේ ඒ අවස්ථාව වන විට රාත්‍රී ජංගම සේවයේ නිරතව සිටි 63020 ආරියවංශ නිලධාරියා සහ දුරකථන ක්‍රියාකරු පො.කො. 29954 ප්‍රියලංක නිලධාරියා ද රැඳී සිටින ලද බවයි. සිරමැදිරි අසළට තමා යන විට අංක 4 සිරමැදිරියේ යකඩ දොරක සායක් හෝ එවැනි මල් සහිත රෙද්දකින් එම රෙද්දෙන් ගැටයක් බෙල්ලට යොදා ගෙන බෙල්ලෙන් එල්ලී ගෙල වැළලා ගෙන සැකකාරියක් සිටි අයුරු නිරීක්ෂණය වූ බවයි. ඉන්පසු තමා එම සැකකාරියගේ දකුණු අත අල්ලා පරීක්ෂා කිරීමේ දී ඇගෙහි රස්නය හා අතේ නාඩි වැටෙන ස්වරූපයක් දැනුණු බවත් ශරීරයේ පණ ඇති ස්වභාවයක් තමා හට දැනුණු බැවින් යකඩ දොරෙහි ගැටය හා බෙල්ලේ ගැටය අතරමැදින් කුඩා පිහි තලයකින් කපා සිරුර බිමට ගත් බවත් ඒත් සමඟ ආහ් ආහ්... යනුවෙන් කෙඳිරිලි ශබ්දයක් ඇසුනු බවත්ය. ඒ අනුව සැකකාරියට කෘත්‍රිම ශ්වසනය ලබා දෙමින් ජංගම රථයට මෙම කාන්තාව නංවා ගන්නා ලද බවයි. එම අවස්ථාවේ දී ද සිහින් කෙඳිරිලි හඬක් ඇසුණු බවත් ජංගම රථයෙන් පො.සැ 63020 ආරියවංශ, පො.කො.29954 ප්‍රියලංක සහ කා.පො.කො. 1234 අංජලිකා යන නිලධාරීන් විසින් සැකකාරිය පෙ.ව. 05.24ට පමණ කොළඹ ජාතික රෝහල වෙත ගෙන ගොස් ඇතුලත් කළ බවයි. පෙ.ව. 5.30ට පමණ මෙම සැකකාරිය මිය ගොස් ඇති බවට රාජකාරි භාර වෛද්‍යවරයා විසින් දන්වා සිටින ලද බවට ස්ථානාධිපතිවරයා විසින් කරුණු දක්වා ඇත.

පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයේහි සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී 2025/03/18 දින පරීක්ෂණයක් පවත්වා ඇති අතර එහිදී සිද්ධියට සම්බන්ධ අනෙකුත් පොලිස් නිලධාරීන් විසින් ප්‍රකාශ සටහන්කොට ඇත.

## 2 වන වගඋත්තරකරු වන පො. ප. කේ.පී.එම්.ආර්.ඩී. සංජය කුමාර මහතා

දෙවන වගඋත්තරකරු වන මරදාන පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති කහටපහේ මුදියන්සේලාගේ දිනේෂ් සංජය කුමාර ජයරත්න විසින් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත්තේ තමා 2025.01.03 සිට මරදාන පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කරන බවත් 2025.01.21 දින පැය 18.10ට අපරාධ අංශයේ නිලධාරීන් සමඟ අපරාධවලට සම්බන්ධ පුද්ගලයින් සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා සංචාරය සඳහා පිටව ගිය බවයි. එහිදී සැකපිට පුද්ගලයන් විශේෂයෙන් සොරකමට හා සොරකමට සැකපිට, අනන්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි වීම මත, වරෙන්තු මත, අයිස් මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් වැනි වරදවල් සඳහා සැකකරුවන් හා සැකකාරියන් අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කළ බවයි. මෙහිදී සිද්ධියට අදාළව අංක 250, වවුනිකුලම්, අරම්කඩේ, අම්බාලපුරම් (මාන්කුලම්) ලිපිනයේ පදිංචි මුත්තයියා කලා දර්ශනි නැමැත්තිය වෙත මාලිගාකන්ද මහේස්ත්‍රාත් උසාවියේ අංක 69657/24 දරණ නඩුවේ විවෘත වරෙන්තු නිකුත් වී තිබූ බැවින් වරෙන්තු පිටපත පෙන්වා දී මරදාන දුම්රිය ස්ථානය ඉදිරිපිට ඇති චීනස් ලොජ් අසලදී පැය 21.45ට අත්අඩංගුවට ගෙන ස්ථානයට රැගෙන විත් උපසේවා රාජකාරියේ යෙදී සිටි පො.සැ 32924 පත්මසිරි නිලධාරියාට භාර දුන් බවයි. ඒ සම්බන්ධව තමා ස්ථානයේ MOIB 74/276 යටතේ තොරතුරු පොතේ සටහන් ඇතුලත් කර ඇති බවයි. මෙම වරෙන්තුකාරිය අත්අඩංගුවට ගන්නා විට රෝස පැහැති බතික් සායක් වැනි ඇඳුමක් සහ රෝස පාට කලිසමක් සමඟ උඩඩ රතු පාට ටී ෂර්ට් එකක් ඇඳගෙන සිටි බවත් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී රෝග ලක්ෂණයක් දක්නට නොලැබුණු බවත් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ සැකකාරිය කලහාකාරි ලෙස හැසිරුණේ නැති බවත් ප්‍රකාශ කර ඇත. ඇය මීට පෙර කිහිප වතාවක් අත්අඩංගුවට පත් වූ කාන්තාවක් වන බවත් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ ඇය සතුව වටිනා කිසිවක් හමු නොවූ බවත් සෙරෙප්පු දෙකක් දාගෙන සිටි බවත් ආභරණ පැළඳ සිටියා ද යන්න පිළිබඳව තමාට හරියට මතකයක් නොමැති බවටත් කොමිසම හමුවේ කරුණු දක්වා ඇත.

## 3 වන වගඋත්තරකරු වන පො. සැ. ඩබ්.පී.එස්.කේ. පද්මසිරි මහතා

තෙවන වගඋත්තරකරු වන විජයලත් ජෙඩිගේ සිසිර කුමාර පත්මසිරි (එදින උප සේවක), විසින් කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වා ඇත්තේ 2025.01.21 වන දින පැය 17.37 ට තමා විසින් දෛනික තොරතුරු සටහන් පොතේ 01, ඡේද 352/3335 අනුව උපසේවා රාජකාරිය භාර ගත් බවයි. ඊට පසු අපරාධ අංශයේ නිලධාරීන් විසින් පැය 22.10ට සුලු පැමිණිලි සටහන් පොතේ 74/276 යටතේ වරෙන්තුකාරියක් වන එම්.කේ.දර්ශනී යන අය ස්ථානයට ඉදිරිපත් කළ බවයි. ඒ අනුව එම සැකකාරිය කා.පො.කො.12334 අංජලිකා ලවා පරික්ෂා කරවා ගැනීමෙන් අනතුරුව සැකකරුවන් රඳවා තබන අංක 04 සිරමැදිරිය තුල ඉහත කාන්තා පොලිස් නිලධාරිනිය භාරයේ රඳවා තැබීමට කටයුතු කළ බවයි. මෙදින රාත්‍රී පැය 23.45, 02.42, 04.15 යන වෙලාවන්වලදී තමා විසින් සිරමැදිරි පරික්ෂා කළ බවත් ඒ අවස්ථාවලදී සැකකාරිය නින්දේ පසුවූ බවත්ය. පැය 04.40ට පමණ සැකකාරිය ඇසුරු කරන තමා පුද්ගලික දන්නා සම්පත් නමැති පුද්ගලයා ඇය බැලීමට පැමිණි බවත් ඒ අනුව ඔහු සමඟ සැකකාරිය රඳවා සිටින සිරමැදිරිය දෙසට යාමේදී ඇය එම සිරමැදිරියේ යකඩ දොරේ යකඩ පටියක ඇය ඇඳගෙන සිටි ගවුමේ කොටස්වලින් ගෙල වැළලාගෙන සිටි බව දක්නා ලද බවත්ය. ඇඳුමේ පාට දම්පාට බවත් එම අවස්ථාවේ ඇය උඩට ඇඳන් හිටිය ටී ෂර්ට් එක ඉවත් කර තිබූ බවත් බ්‍රේෂියර් එක පමණක් උඩුකය තිබුණ බවත් යටට යට කලිසම හැඳ සිටි බවත්ය. ඉන්පසු ස්ථානයේ ස්ථානාධිපතිතුමාට මෙම පණිවිඩය දැනුම් දුන් බවත් අනතුරුව ඇයව රාත්‍රී ජංගම රථයේ ආධාරයෙන් කොළඹ ජාතික රෝහල වෙත රැගෙන යාමට පියවර ගන්නා ලද බවත්ය. එහිදී වේලාව 04.45 පමණ වූ බවත් මෙම අවස්ථාවේදි එම පුද්ගලයා රැගෙන ගියේ පො.සැ 63020 ආරියවංශ භාරයේ තිබූ ජීප් රථයෙහි බවයි. මෙම අවස්ථාව වන විට ස්ථානාධිපතිතුමා චෝදනාගාරයට

පැමිණ අවශ්‍ය උපදෙස් ලබා දුන් බවත් මෙම කාලය තුළ රාජකාරි භාර නිලධාරි ලෙස උ.පො.ප ප්‍රේමචන්ද්‍ර මහතා රාජකාරි කළ බවත්ය. මෙම මිය ගොස් සිටි වරෙන්තුකාරිය හට රාත්‍රී ආහාර ලබා දුන්නේ නොමැති බවද ප්‍රකාශ කොට ඇත. මෙම සිදුවීම වන අවස්ථාවේ සිරමැදිරියේ පිරිමි පුද්ගලයන් 33ක් හා කාන්තා සිරකාරියක ලෙස මෙම කාන්තාව පමණක් රඳවා සිටි බවයි. ඒ අනුව මුළු සිරකරුවන් ගණන 34 වූ බවයි. මෙම සිරකාරිය භාරගන්නා අවස්ථාවේ නළලේ ආවරණය කරන ලද තුවාලයක් තිබුණ බවත් මෙම කාන්තාව පරීක්ෂා කරන අවස්ථාවල 'ඇඟට අමාරුයි අයිස් ටිකක් හොයාගන්න නැද්ද' ලෙස තමාගෙන් විමසූ බවත් මේ වේලාවේ මත්ද්‍රව්‍ය නොමැතිව සික් ගතියකින් වගේ ඇය සිටි බවටද කොමිසම හමුවේ කරුණු දක්වා ඇත.

<u>3 වන වගඋත්තරකරු වන කා.පො.කො. අංජලිකා සේනානි ගමගේ මිය</u>

සිව්වන වගඋත්තරකරු වන මරදාන පොලිසියේ කා.පො.කො.12334, මතුගමගේ දොන් අංජලිකා සේනානි ගමගේ විසින් කොමිසම හමුවේ ප්‍රකාශයක් ලබා දෙමින් කියා ඇත්තේ තමා 2021.09.24 දින සිට පළමු පත්වීම ලෙස මරදාන පොලිස් ස්ථානයට පත්වීම් ලබා මේ දක්වා එහි අපරාධ අංශයට අනුයුක්තව රාජකාරී සිදු කරන බවයි. 2025.01.21 දින ස්ථානයේ උදෑසන රාජකාරියට වාර්තා කිරීමෙන් පසු තමාට යොදා තිබුණ නියෝගය අනුව තමා මාලිගාකන්ද අධිකරණයේ කාන්තා පරීක්ෂා කිරීම සඳහා වන මුරපොලෙහි රාජකාරියට වාර්තා කළ බවයි. එම රාජකාරි අවසන් වූයේ පැය 18.00ට බවත් ඉන්පසුව නැවත ස්ථානයට පැමිණ පැමිණීම සටහන් කර තම බැරැක්කයට ගිය බවත්ය. ඉන්පසු ස්ථානයේ උපසේවක මහතා විසින් කාන්තා සැකකාරියක් ස්ථානයේ සිටින බවට කළ දැනුම් දීමෙන් අනතුරුව නැවත පොලිස් ස්ථානයේ චෝදනාගාරයේ ආරක්ෂක රාජකාරිය සඳහා තම මතකයේ හැටියට පැය 22.50ට පමණ සේවයට වාර්තා කළ බවයි. ඒ වන විට සැකකාරිය 04වන සිරමැදිරිය තුළ රඳවා සිටි බවයි. සිරමැදිරිය තුළදී අදාළ සැකකාරියගෙන් තමා එහි වැඩ භාර ගත් අවස්ථාවේම සුලු පැමිණිලි සටහන් පොතෙහි ප්‍රකාශ සටහන් කර ගත් බවත් එම සැකකාරිය නිතර ස්ථානය වෙත රැගෙන එන කාන්තාවක් වන බවටත් ප්‍රකාශ ලබා දී ඇත. ඇය මරදාන වීනස් ලොජ්හි සිටියදී අත්අඩංගුවට ගෙන තිබූ බවත් අයාලේ යාම සම්බන්ධව පැවැති නඩුවක වරෙන්තුවක් මත එසේ අත්අඩංගුවට ගෙන තිබූ බවත්ය. (නඩු අංක 69657/24) එම ප්‍රකාශ ලබා ගන්නා අවස්ථාවේදි එම සිරකාරිය සාමාන්‍ය ලෙස කථාබහ කර සිටි බවත් අවශ්‍යතාවයක් ඇති වුවහොත් කථා කරන ලෙස තමා ඇයට කියා සිටි බවත්ය. තමා සිටියේ සිරමැදිරිය ළඟ චෝදනාගාරය තුළ බවත් එම සිරමැදිරිය සඳහා ගමන් කරන කොරිඩෝව ළඟ ඇති ගේට්ටුව සාමනා යෙන් අගුල් දමා තිබෙන බවත් මෙම සැකකාරිය මැද පිහිටි සිරමැදිරියක් වන අංක 4හි රඳවා තිබූ බවත්ය. එතැන දෙපැත්තේ තිබූ සිරමැදිරි අංක 5 හා 3 යන සිරමැදිරිවල පිරිමි සැකකරුවන් රඳවා සිටි බවත්, එබැවින් එම ස්ථානයේ එක දිගට වාඩිවෙලා සිටීම තමාට අපහසු බැවින් තමා චෝදනාගාරය තුළ වාඩිවී සිටින ලද බවයි. චෝදනාගාරය හා සිරමැදිරි අතර පරතරය ලෙස ගේට්ටුව පවතින බවත් චෝදනාගාරයට සිරිමැදිරි නොපෙනෙන බවත් පළමු හා දෙවන සිරමැදිරි පමණක් පෙනෙන බව ප්‍රකාශ කරන ලදී. අනිකුත් සිරමැදිරි බැලීමට එම සිරමැදිරිවල ලඟටගොස් බැලීමට සිදුවන බවයි. මෙම සැකකාරිය සිටි සිරමැදිරිය බැලීමට තමා අවස්ථා පහක් හයක් පමණ ගිය බවත් එම සෑම වේලාවකම ඇය නිදාගෙන සිටි බවත්ය. පැය 04.00 හෝ පැය 04.15 කාලය තුල දී උපසේවා පරීක්ෂා කිරීම සඳහා යන විට තමාද ඒ සමඟ සිරමැදිරි පරීක්ෂා කරන්න ගිය බවත් ඒ වේලාවන්හි මෙම සිරකාරිය නිදාගෙන සිටි බවයි. එසේ බලා තමා රාජකාරි භාර නිලධාරි අසුන ළඟට වී සිටි බවට ප්‍රකාශ ලබා දී ඇත. ඉන්පසු ටික වේලාවකින් තමා වැසිකිළි යාම සඳහා පැය 04.30ට පමණ කාන්තා බට නිවාසය වෙත ගිය බවයි. ඒ අවස්ථාවේ ස්ථානය තුළ කුමක්දෝ ශබ්දයක් ඇසුන බවට බැරැක්කයේ ඒ වේලාවේ හිටපු කාන්තා නිලධාරින් තමාට කී බවත් එම ශබ්දය තමාටද ඇසුන බවත් ප්‍රකාශ කරන ලදී. ඒත් සමඟම තමා ආපසු චෝදනාගාරයට කඩිනමින් ආ බවත් එනවිට සිරමැදිරිය අසළ උප සේවක මහතා, රාජකාරි භාර නිලධාරි මහතා, දුරකථන ක්‍රියකරු හා

VPN ක්‍රියාකරු සිටි බවයි. ඒ වේලාවේ මෙම කාන්තාව බලන්නට ආව කෙනෙකු එම සිරමැදිරිය ළඟ සිට චෝදනාගාරයෙන් එළියට ගිය බවයි. ඒ වේලාවේ ඒ පුද්ගලයා සම්පත් යන අය ලෙස තමා දැනගත් බවයි. ඊට පසු තමා සිරමැදිරිය ළඟට ගොස් බලන විට සැකකාරිය සිරමැදිරියේ යකඩ කූඩුවලට හේත්තු වී කකුල් බිම වදින සේ සිටි බවත් ගෙල තද වී ඇති බවක් පෙනුණු බවත්ය. ඒ වේලාවේ විනාඩි හතරක් පහක් වගේ කාලයකින් ගැටය කැපූ බවත් කැපුවේ පිහියකින් හෝ කඩදාසි කපන එකකින් VPN ක්‍රියාකරු හෝ TO මහතා විසින් බවත්ය. තමා ඇතුලු පස්දෙනෙකු ඇය අල්ලාගෙන ගොස් ජංගම රථයට උස්සා දාගත් බවයි. මේ වේලාවේ සැකකාරිය ටී ෂර්ට් එක නැතුව සිටි බවත් ඇය දැගලුවේ නොමැති බවත් ගැටේ ගැලෙව්වාට පසු සැකකාරිය කෙඳිරි ගෑ බවත් රෝහල වෙත රැගෙන යනකන්ම කෙඳිරි ගෑ බවටත් ප්‍රකාශ ලබා දී ඇත. එවිට ඇයගේ මූණට වතුර ඉස්ස නමුත් ඇය කථා නොකළ බවත් දැගලුවේ හෝ නොමැති බවත්ය. රෝහලට රැගෙන යන අතරතුර ඇයගේ පපුව සෙමින් තද කළ බවත් ඒ වේලාවේ ඇය කෙඳිරි ගාමින් සිටි බවත්ය. පොලිස් ස්ථානයෙන් රැගෙන ගොස් රෝහලට 5.20ට ඇතුලත් කළ බවත් තමා මෙම සැකකාරිය පිළිබඳ තොරතුරු වෛද්‍යවරයා වෙත ලබා දුන් බවත් වෛද්‍යවරයා විසින් පැය 05.30ට පමණ රෝගියා මිය ගිය බව තමාට දැනුම් දුන් බවටත් ප්‍රකාශ ලබා දී ඇත. මෙම සැකකාරිය රෑට කෑම කා සිටින බව තමාට කී බවත් එම කෑම ගෙනත් දී තිබුණේ ඇය සිටි වීනස් ලොජ් එකෙන් බව ඇය තමාට කියූ බවටත් ප්‍රකාශ කොට ඇත. තමා සමඟ මෙම සැකකාරිය රෝහල වෙත ගෙන යන විට ජංගම රථයේ රියදුරු, ජංගම රථයේ රාජකාරි භාර නිලධාරි වන ආරියවංශ මහතා, VPN ක්‍රියාකරු, දුරකථන ක්‍රියාකරු වශයෙන් නිලධාරින් 05 දෙනෙකු පමණ රථයේ ගිය බවටත් කොමිසම හමුවේ කරුණු දක්වා ඇත.

<u>නිරීක්ෂණ</u>

- මියගිය වින්දිත වන මුත්තයියා කලා දර්ශනී නමැත්තිය අත්අඩංගුවට ගැනීම පිළිබඳ අවධානය යොමු කිරීමේදී සිද්ධිය සම්බන්ධයෙන් 2025/03/08 වන වගඋත්තර පාර්ශවය කැඳවා මෙම කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණ අවස්ථාවේදී සිද්ධිය සිදු වූ දින උප සේවා රාජකාරි සිදු කළ පො.සැ.32924 ඩබ්.පී.එස්.කේ. පද්මසිරි නිලධාරියා විසින් කොමිසම හමුවේ කරුණු දක්වා ඇත. එම කරුණු දැක්වීම අනුව රාත්‍රී කාලයේ අයාලේ යාම වරද සම්බන්ධයෙන් අධිකරණයට ඉදිරිපත් නොවීම මත විවෘත වරෙන්තුවකට මුත්තයියා කලා දර්ශනී නමැති සැකකාරිය මරදාන දුම්රිය ස්ථානය ඉදිරිපිටදී අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කර තිබූ බවයි. තමා විසින් පැය 22.10ට පමණ එම සිරකාරිය භාර ගෙන සිරමැදිරියට යොමු කිරීමෙන් පසු සිද්ධිය සිදුවන තෙක් අවස්ථා තුනකදී (රාත්‍රී පැය 23.45, 02.42, 04.15 යන අවස්ථාවලදී) සිරමැදිරි පරීක්ෂා කිරීම සඳහා ගිය බවය. ඒ පිළිබඳ සටහන් දෛනික තොරතුරු සටහන් පොත 1හි පිටු අංක 390 ඡේදය 3551, පිටු අංක 391 ඡේදය 3557, පිටු අංක 391 ඡේදය 3560 හි ඇතුළත් කර ඇති අයුරු නිරීක්ෂණය වේ. තවද තමාට විවේක අවස්ථාවන්හිදී සැකකරුවන් පරීක්ෂා කිරීමට යන බවත් එයට හේතුව ලෙස රාත්‍රී කාලයේ වැඩි සිරකරුවන් ප්‍රමාණයක් (එදින සැකකරුවන් 29) වරින්වර ස්ථානයට ඉදිරිපත් කරන බැවින් ඔවුන් පරීක්ෂා කරමින් නඩු භාණ්ඩ පරීක්ෂා කරමින් සිරමැදිරිවලට යොමු කිරීමට කටයුතු කරන නිසා වැඩි වේලාවක් ඒ සඳහා ගතවන බැවින් ඒ අතරතුර ලැබෙන අවස්ථාවන්හිදී සැකකරුවන් පරීක්ෂා කිරීම සිදු කරන බවටය. තවද සිරමැදිරිය තිබෙන්නේ උපසේවක සිටින ස්ථානයේ සිට මීටර් 25ක් 30ක් පමණ දුරින් වන බවත් උපසේවකට එම ස්ථානයේ සිට සිරමැදිරි කිසිසේත්ම නිරීක්ෂණය නොවන බවටද කරුණු දක්වා ඇත. සැකකාරියගේ ආරක්ෂාවට කාන්තා නිලධාරිනියක් යොදවා සිටින බැවින් උපසේවක වශයෙන් තමා පොලිස් ස්ථානය වෙත පැමිණෙන බාහිර පුද්ගලයන් සම්බන්ධයෙන් උපසේවක රැඳි සිටින ස්ථානයේ සිට විමසිලිමත්ව සිටියයුතු බවට කරුණු දක්වා ඇත. මෙකී ප්‍රකාශ අනුව උප සේවක වෙත පැවරී ඇති රාජකාරී අධික වීම නිසාවෙන් සැකකරුවන් අධීක්ෂණය සඳහා යෙදවිය

යුතු කාලය වෙනත් රාජකාරී සඳහාද යොමු කිරීමට සිදුව ඇති බැවින් එය සැකකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය අඩු වීමට බලපා ඇති බව නිරීක්ෂණය වේ. තවද සිරමැදිරිවල පිහිටීම අනුව සිරමැදිරි සම්පූර්ණයෙන්ම උපසේවක මහතාට නිරාවරණය නොවන බවට කරුණු අනාවරණය වූ අතර උපසේවක සෘජුව අධීක්ෂණය වන ආකාරයට සිරමැදිරි පිහිටා තිබුණේ නම් මෙම සැකකාරිය ගෙලවැලලා ගැනීම සම්බන්ධයෙන් පූර්වයෙන් යම් අවබෝධයක් ලබා ගැනීමට හැකියාවක් පැවති බවද පෙනී යයි.

- තවද සිද්ධිය සිදු වූ දින උපසේවා රාජකාරී සිදුකළ 3වන වගඋත්තරකරු වන පො. සැ. ඩබ්.පී.එස්.කේ. පද්මසිරි මහතා කොමිසම හමුවේ කරුණු දක්වා තිබුණේ මෙම සැකකාරිය සිරමැදිරියට යොමු කිරීමෙන් පසුව තමා සිරකාමරවල සිටින්නන් පරීක්ෂා කිරීමට ගිය මුල් අවස්ථාවේදී සැකකාරිය විසින් **'ඉන්න අමාරුයි අයිස් නැද්ද'** යනුවෙන් තමාගෙන් විමසූ බවත් ඇය එසේ විමසුවේ ඇය මත්ද්‍රව්‍ය වලට දැඩි ලෙස ඇබ්බැහි වූ අයෙක් වන නිසා බවත්ය. තමා එලෙස ප්‍රකාශ කරන ලද්දේ එම සැකකාරිය නිතර නිතර මරදාන පොලිස් ස්ථානයට අත්අඩංගුවට පත්වන කාන්තාවක් වන බැවින් ඒ පිළිබඳ සාමාන්‍යයෙන් දන්නා කරුණු මත බවයි. නමුත් සැකකාරිය වෙතින් යම්කිසි රෝගී තත්වයක් හෝ එවැනි ගැටලුවක් දක්නට නොලැබුණ බවත් සැකකාරිය විසින්ද වෛද්‍ය ප්‍රතිකාරයක් සඳහා ඉල්ලීමක් සිදු නොකළ බවයි. එම ප්‍රකාශ සත්‍ය නම් ඇය මත්ද්‍රව්‍ය නොමැති වීම නිසාවෙන් එම අවස්ථාවේ දැඩි ව්‍යාකූලත්වයකට පත්ව සිට ඇතැයි යන්න නිගමනය කළ හැකිය. කෙසේවෙතත් මත්ද්‍රව්‍යට දැඩි ලෙස ඇබ්බැහි වූ පුද්ගලයන් හා ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇති අතර වගඋත්තර පාර්ශවය ප්‍රකාශ කරන පරිදි මියගිය තැනැත්තිය මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ තැනැත්තියක බව ඔවුන් දැන සිටියේ නම් ඇය වෙත විශේෂ අවධානයක් යොමු කළ යුතු වුවද මෙම සිදුවීමේ දී එවැනි විශේෂ අවධානයක් සැකකාරිය වෙත යොමු වී නොමැති බව නිරීක්ෂණය වේ.

  **පොලීසියේ ආරක්ෂාව භාරයේ සිටින තැනැත්තන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ නීතිරීති පොලිස් නියෝග ඒ 20 හි දක්වා ඇත. එහි නියෝග අංක 5(ඊ) හි දක්වා ඇත්තේ යටත් පිරිසෙයින් දෙපැයකට වරක්වත් උපසේවා රාජකාරියේ නියුක්ත පොලිස් නිලධාරියා සිරකාමරවල සිටින තැනැත්තන් බලන්නට යා යුතු බවටයි. තවද උමතු හෝ බීමත් තැනැත්තන් සිටින විට මෙම නිලධාරියා පැය භාගයකට වරක් වත් ඔවුන් බලන්නට යා යුතුය.** නමුත් උපසේවක නිලධාරියාගේ ඉහත ප්‍රකාශ අනුව මෙම සිද්ධියේදී එම නියෝගය පරිදි උප සේවක විසින් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වන අතර එසේ කිරීමට නොහැකි වීම සම්බන්ධව ඔහු විසින් නිදහසට කරුණු දක්වා ඇති අතර උපසේවකට වෙනත් රාජකාරීද පැවරී තිබීම එයට හේතුව ලෙස දක්වා ඇත.

- 2025/03/08 වන දින මෙම කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණ අවස්ථාවේදී කා.පො.කො. එම්.ඩී. අංජලිකා සේනානි නිලධාරිනිය විසින් ප්‍රකාශයක් ලබා දෙමින් කරුණු දක්වා ඇත්තේ සැකකාරියක් අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කර ඇති බවට එදින උපසේවා රාජකාරී ඉටුකළ නිලධාරියා විසින් තමාට කළ දැනුම් දීම අනුව තමා බට නිවාසයේ සිට චෝදනාගාරය වෙත පැමිණි බවයි. එම සැකකාරිය වන මුත්තයියා කලා දර්ශනී විවෘත වරෙන්තුවක් මත අත්අඩංගුවට ගෙන තිබූ බව ප්‍රකාශ කළ බැවින් ඇයව පරීක්ෂා කර බලා 4වන සිරමැදිරියට යොමු කර පැය 22.55ට පමණ සිරමැදිරිය අසළ පුටුවක තමා වාඩි වී සැකකාරියගෙන් ප්‍රකාශයක් සටහන් කළ බවයි. එය සුලු අපරාධ තොරතුරු සටහන් පොතේ

77/277 හි සටහන් කර ඇති අතර මරණකාරියගේ අත්සන ප්‍රකාශයට පහළින් යොදා ඇති අයුරුද නිරීක්ෂණය වේ. ඉන්පසුව ඇයට පැය 23.15ට පමණ උපසේවක මගින් කෑම ලබා දුන් බවත් ප්‍රකාශය ලබා ගැනීමේදී තමා ඇසූ ප්‍රශ්නවලට ඇය හොඳින් පිළිතුරු ලබා දුන් බවත් ඇය නිතර අත්අඩංගුවට පත්ව පොලිසිය වෙත ගෙනෙන මත්ද්‍රව්‍ය වලට ඇඩි ලෙස ඇබ්බැහි වූ අයෙකු බවත් අයිස් මත්ද්‍රව්‍ය ලබා දිය හැකිද යනුවෙන් තමාගෙන් කිහිප විටකදීම සැකකාරිය ඇසූ බවත් ප්‍රකාශ කොට ඇත. නමුත් ඒ සම්බන්ධයෙන් තමා විසින් ප්‍රකාශ සටහන් කිරීමක් සිදුකර නොමැති බවත් සාමාන්‍යයෙන් එම කාන්තාව බොහෝ අවස්ථාවන්වලදී එලෙස මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් විමසන බැවින් ඒවා සටහන් කිරීමක් සිදු නොකරන බවයි. එම නිලධාරිනියගේ ප්‍රකාශ අනුව මත්ද්‍රව්‍යට දැඩි ලෙස ඇබ්බැහි වූ අයෙකු යැයි කියන සැකකාරිය සම්බන්ධයෙන් ආරක්ෂක නිලධාරිනියගේ විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇති නමුත් ඇයගෙන්ද එවැනි විශේෂ අවධානයක් සැකකාරිය වෙත යොමු වී නොමැති බව නිරීක්ෂණය වේ.

තවද තමා පැය 4.30ට පමණ එදින රාජකාරීභාර නිලධාරියා වන උ.පො.ප. ප්‍රේමචන්ද්‍ර නිලධාරියා වෙත දන්වා වැසිකිලියට යාම සඳහා බට නිවාසය වෙත ගිය බවත් නැවත පැය 4.40ට පමණ සිරමැදිරිය වෙත ආ විටදී සැකකාරිය සිරමැදිරිය තුළ ගෙලවැලලාගෙන සිටින බවත් සිරමැදිරිය අසළ උපසේවක මහතාද තමා එන විට සිටි බවටත් සැකකාරියගේ ආරක්ෂාවට සිටි නිලධාරිනිය විසින් කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වා ඇත. ඒ අනුව ආරක්ෂාවට සිටි නිලධාරිනිය වැසිකිළියට ගියා යැයි කියන කාලය තුළදී සැකකාරිය විසින් ගෙල සිරකර ගැනීමට කටයුතුකර ඇති බවට කරුණු නිරීක්ණය වේ. මෙහිදී කොමිෂන් සභාව හමුවේ අනාවරණ වූයේ මෙම නිලධාරිනිය සැකකාරියගේ ආරක්ෂාවට සිටි නිලධාරිනිය ලෙස එම ස්ථානයෙන් බැහැරව යන විටදී එම නිලධාරිනිය වෙනුවට වෙනත් නිලධාරිනියක් යොමු කිරීමක් සිදු වී නොමැති බවටය. නිලධාරිනිය ඒ සම්බන්ධයෙන් කරුණු දක්වා ඇත්තේ එලෙස වෙනත් නිලධාරිනියක් යෙදවීමට අවස්ථාවක් නොමැති බවත් තමා තනිව රාජකාරී යොදවා තිබූ බවත් තමා රාජකාරී භාර නිලධාරියාට රාජකාරියෙන් පිටයව යන බව දැනුවත් කළ බවටත්ය. කාන්තා පොලිස් නිලධාරිනියන් දිවා රාත්‍රී සේවයේ යොදවා සිටින බැවින් එකම නිලධාරිනියක් පමණක් ඒ සඳහා සාමන්‍යයෙන් යොදා ගන්නා බවටද කරුණු අනාවරණය විය. මෙලෙස එක් නිලධාරිනියක් විසින් එක දිගට දිවා රාත්‍රී සේවා සැපයීම තුළින් ඔවුන් වෙහෙසට පත්වීම නිසා සැකකරුවන්ට අවශ්‍ය ආරක්ෂාව නිසි පරිදි සැපයීමට හැකියාවක් ඇතිද යන ගැටලුව ඉස්මතු වේ. මෙකී කරුණු අනුව සැකකාරියට අවශ්‍ය නිසි අධීක්ෂණය ලබා දීමට සැකකාරියගේ ආරක්ෂාවට සිටි නිලධාරිනිය අපොහොසත් වී ඇති අයුරු නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම අවස්ථාව පිළිබඳව නිසි අධීක්ෂණයක් හෝ නිරීක්ෂණයක් අදාළ ඉහල බලධාරීන් විසින් සිදුකර නොමැති බව ද කොමිෂන් සභාවට පෙනී යයි. විශේෂයෙන්ම මෙම සිද්ධිය සිදුවන අවස්ථාවේ රාජකාරී සිදුකළ 3 වන හා 4 වන වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු කිරීමට 1වන වගඋත්තරකරු අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය වේ. **පොලිස්පති චක්‍රලේඛන අංක 2328/2011 හි පොලිස් අත්අඩංගුවේ පසුවන සැකකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය දක්වා ඇති අතර එකී චක්‍රලේඛනයේ XI හි අත්අඩංගුවට ගනු ලබන සියලු පුද්ගලයින්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව සහතික කරන අයුරින් කටයුතු කිරීමට සියලුම ස්ථාන භාර නිලධාරීන් වගකීමෙන් බැඳෙන බව සඳහන්ව ඇත.**

- තවද තමා සාමාන්‍යයෙන් සිරමැදිරිය අසළ චෝදනාගාරය තුළ රැඳී සිටින බවත් සිරමැදිරිය සඳහා ගමන් කරන කොරිඩෝව ලඟ ගේට්ටුව සාමාන්‍යයෙන් ලොක් කර තිබෙන බවත් සැකකාරිය අංක 04 වන මැද සිරකාමරයේ රඳවා තිබූ බවත් එයට දෙපස සිරිමැදිරි තුළ පිරිමි සැකකරුවන්

රඳවා සිටි බැවින් එම ස්ථානයේ එක දිගට වාඩි වී සිටීම අපහසු බැවින් තමා චෝදනාගාරය තුළ වාඩි වී සිටින බවටද සැකකාරියගේ ආරක්ෂාවට සිටි නිලධාරිනිය කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ ලබා දී ඇත. චෝදනාගාරය හා ගේට්ටුව අතර පරතරයක් පවතින බවත් චෝදනාගාරයට සිරමැදිරි නොපෙනෙන බවත් 1 හා 2 සිර මැදිරි පමණක් පෙනෙන බවත් සිර මැදිරි බැලීමට නම් ඒවා ලගට ගොස් බැලිය යුතු බවටත් තමා අවස්ථා පහක් හයක් පමණ සිර මැදිරි බැලීමට ගිය බවටත් ඇය විසින් කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වා ඇත. ඉහත හේතු නිසාවෙන් සැකකාරිය අසළ එක දිගට රැදී සිටීමට අපහසුතාවයක් ආරක්ෂක නිලධාරිනිය වෙත පැවතියේ නම් එම අවශ්‍යතාවයට අනුව අදාළ සැකකාරිය සිර මැදිරි අංක 1හි රඳවා තබාගෙන පිරිමි සැකකරුවන් 2,3,4 සිර මැදිරි වෙත යොමු කිරීමට හැකියාවක් පවතින බව නිරීක්ෂණය වේ. වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන ආකාරයට සැකකාරිය මත්ද්‍රව්‍යවලට දැඩි ලෙස ඇබ්බැහි වූ තැනැත්තියක් නම් හා ඇය මත්ද්‍රව්‍ය නොමැතිව ව්‍යාකූල තත්වයකට පත්ව සිටියා නම් ඇයව එලෙස ආරක්ෂක නිලධාරිනියට ඍජුව නිරීක්ෂණය වන අයුරින් රඳවා තබා ගැනීම සිදු කළ යුතුව පැවතියත් එවැන්නක් සිදු නොවූ බවට කරුණු නිරීක්ෂණය වේ.

- තවදුරටත් කොමිෂන් සභාව හමුවේ අනාවරණය වූ කාරණයක් වූයේ මීට පෙර මරදාන පොලිස් ස්ථානයේ ආරක්ෂක මාතාවන් ලෙස බාහිර පුද්ගලයන් සේවයේ යොදවා තිබූ නමුත් මේ වන විට එය ක්‍රියාත්මක නොවන බවය. පාලන අංශය මඟින් යම් යම් අවස්ථාවල ආරක්ෂක මාතාව වශයෙන් කාන්තාවන් යොදවාගැනීමට කටයුතු කළත් අඛණ්ඩව යොදවා ගැනීමක් සිදු නොකරන ලද බවය. ඔවුන්ට ගෙවීම් සම්බන්ධයෙන් ඇති ගැටලු නිසා ඔවුන්ගේ සේවය ලබා ගැනීමට නොහැකි වී ඇති බවටද වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වා ඇත. ආරක්ෂක මාතාවක් නොමැති නිසා ඒ වෙනුවට ස්ථානයේ සිටින කාන්තා පොලිස් නිලධාරිනියක් සැකකාරියන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන අවස්ථාවලදී ඔවුන්ගේ ආරක්ෂාව සඳහා යෙදවීමට ස්ථානාධිපතිවරයා විසින් කටයුතු කරන බවටද කරුණු ඉදිරිපත්ව ඇත. මේ අනුව සැකකාරියන්ගේ ආරක්ෂාව සඳහා ඒ වෙනුවෙන් වෙන් වූ පූර්ණකාලීනව ආරක්ෂක මාතාවක් හෝ පොලිස් නිලධාරිනියක් යෙදවීමේ අවශ්‍යතාව මෙම සිදුවීම මඟින් ඉස්මතු කරනු ලැබේ. පූර්ණකාලීන සේවා සපයන එවැන්නකු සිටියේ නම් මෙවැනි සිදුවීම් වළක්වා ගැනීමට හැකියාවක් පවතින බවද නිරීක්ෂණය වේ.

- ඉහත සියලු කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී වගඋත්තරකාර පාර්ශවය මෙම සැකකාරිය කෙරෙහි ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු කර නොමැති අතරම පොලිස් නියෝග ඒ 20, හා පොලිස්පති චක්‍රලේඛ 2328/2011 හි සඳහන් නෛතික ප්‍රතිපාදන නිසි ආකාරව ක්‍රියාත්මක කර නොමැති බවද නිරීක්ෂණය වේ.

- වින්දිත පාර්ශවය වෙත නිකුත් කර ඇති අංක 123/01/2025 දරණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව අනුව වෛද්‍යවරයා විසින් මෙම මරණයට හේතුව එල්ලීම (Hanging) ලෙස දක්වා ඇත. තවද ගෙලෙහි ඉහළ කොටසේ 23×1.5cm ප්‍රමාණයේ සීරීම් ලකුණක්, ගෙලෙහි දකුණු පැත්තේ දකුණු කනට පහලින් 2.5cm හා ගෙලෙහි වම් පැත්තේ 3cm සීරීම් තුවාල ද ගෙලෙහි පිටුපස 7cm පමණ තුවාල රහිත පරතරයක්ද පවතින බවට හඳුනාගෙන ඇත. තවද නලලේ වම් පැත්තේ 3cm නව කැපුමක් ද වම් දණහිස මත 2×1cm ප්‍රමාණයේ සීරීමක් හා වම් දණහිසේ පහලට වන්නට 2×1cm බහු සමාන්තර රේඛීය සීරීම් හඳුනා ගෙන ඇත. නමුත් ශාරීරික හිංසනයක් සිදු වී ඇතැයි කීමට තරම් මතුපිටින් පෙනෙන සාක්ෂි නොමැති බව එහි දක්වා ඇත.

- මරණකාරිය මීට පෙර අවස්ථාවන්හිදී හෙරොයින්, අයිස් හා ගංජා මත්ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීමේ වරදවල් මත මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවට පොලිස් ස්ථානය විසින් ඉදිරිපත් කර ඇති ලේඛන මඟින් කරුණු නිරීක්ෂණය වන අතර එසේම, වගඋත්තරකරුවන් විසින් මරණකාරිය සම්බන්ධව මෙම කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ අනුව ඇය දැඩි ලෙස මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ කාන්තාවක් ලෙස කරුණු දක්වා ඇති බව නිරීක්ෂණය වේ. නමුත් අදාළ සැකකාරියගේ අත්අඩංගුවට ගැනීමට අදාළ ප්‍රකාශ සටහන් කර ගැනීමේදී හෝ සැකකාරිය අත්අඩංගුවේ සිටියදී පොලිස් නිලධාරීන් වෙතින් මත්ද්‍රව්‍ය ඉල්ලා සිටි බවට කිසිදු සටහනක් අදාළ ලේඛනයන්හි තබා නොමැති බව නිරීක්ෂණය වේ. නමුත් වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කරන ලද පරිදි මියගිය තැනැත්තිය සමඟ සමීප සබඳතාවක් පවත්වා ඇති උපුලනගේ චමින්ද සම්පත් නැමැත්තා සහ මියගිය තැනැත්තිය සේවය කළා යැයි කියන වීනස් ලොජ් ආයතනයේ කළමණාකරු වන එම්.ජේ.එස්. වේලුසාමි අය අයවලුන් විසින් පොලිස් ස්ථානය වෙත ලබා දී ඇති ප්‍රකාශයන්හි මරණකාරිය මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ අයෙකු වන බවට කරුණු දක්වා ඇත. නමුත් එම කරුණු මඟින් මරණය සිදු වන අවස්ථාවේදී සැකකාරිය මත්ද්‍රව්‍ය භාවිත කර සිටි බවක් තහවුරු නොවේ. ඒ අනුව මරණය සිදු වන අවස්ථාවේදී සැකකාරිය මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බවට ප්‍රමාණවත් කරුණු අනාවරණය නොවේ.

- මරණකාරිය සම්බන්ධව ඉදිපත් කර ඇති පශ්චාත් මරණ පරීක්ෂණය සම්බන්ධයෙන් වෛද්‍යවරයා විසින් ලබා දී ඇති වාර්තාව අනුව මරණකාරිය මරණය සිදුවන අවස්ථාව වන විට මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බවට තහවුරු වීමක් නොමැත. මලසිරුර පරීක්ෂාවේදී එහි මුත්‍රා සාම්පල ලබා ගැනීමට හැකියාවක් නොතිබී ඇති බව සඳහන්ව ඇති අතර ඒ අනුව ශරීරයේ මත්ද්‍රව්‍ය අන්තර්ගත වූවාද නැද්ද යන්න නිශ්චිතව තහවුරු කර ගැනීමට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වේ. නමුත් ශරීර කොටස් වැඩිදුර විමර්ශණ කටයුතු සඳහා යොමු කර ඇති බවට එම වාර්තාව මඟින් වෛද්‍යවරයා කරුණු ඉදිරිපත් කර ඇත.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද කරුණු සමස්ථයක් ලෙස සළකා බැලීමේදී වින්දිත පාර්ශවය වෙත නිකුත් කර ඇති පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව හා ඉදිරිපත් වී ඇති අනෙකුත් කරුණු අනුව මෙම මරණය 'එල්ලීම' නිසා සිදු වූ මරණයක් ලෙස නිගමනය කළ හැකි අතර සැකකාරියට පහරදීමක් හෝ වදහිංසාවක් සිදු කළ බවට සාක්ෂි ඉදිරිපත් වී නොමැත. සැකකාරිය සඳහා ආරක්ෂාව සැපයීමට සිටි නිලධාරිනිය හෝ උපසේවක රාජකාරී සිදු කළ නිලධාරියා සැකකාරිය අසළ නොමැති අවස්ථාවකදී සැකකාරිය විසින් තමා ඇඳ සිටි ඇඳුම් භාවිත කරමින් ගෙල වැලලාගෙන ඇති බවට කරුණු අනාවරණය වේ. විශේෂයෙන්ම සැකකාරියගේ ආරක්ෂාවට රාජකාරියේ යොදවා සිටි පොලිස් නිලධාරිනිය සැකකාරියට නිසි අධීක්ෂණයක් ලබා දීමට අපොහොසත් වී තිබීම හේතුවෙන් මෙම මරණය සිදුවීමට අවකාශ ලැබී ඇති බවට කරුණු නිරීක්ෂණය වේ. මෙකී කරුණු අනුව වගඋත්තර පාර්ශවය විසින් සැකකාරියට අවශ්‍ය නිසි අධීක්ෂණය ලබා දීමට අපොහොසත්ව ඇති බවට නිගමනය කරනු ලැබේ.

පොලිස් ස්ථානයක සාමාන්‍ය ක්‍රමවේදය වනුයේ සැකකරුවන්ගේ ආරක්ෂාව සඳහා ආරක්ෂක මාතාවක් යටතේ කාන්තා සැකකාරියන් රඳවා තැබීම වුවද සිද්ධිය සිදුවන දිනය වන විට ආරක්ෂක මාතාවක් රාජකාරියේ යෙදවීමට පියවර නොගැනීම තුළින් අදාළ පොලිස් නිලධාරිනිය දිවා රාත්‍රී සේවයේ යෙදවීමේ හේතුව මත සැකකාරිය පිළිබඳ සමීප අධීක්ෂණය අතපසුවීම නිරීක්ෂණය වේ. මේ හේතුවෙන් තමා

භාරයේ සිටින කාන්තා සැකකාරියන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව වූ නෛතික ප්‍රතිපාදන අනුව නිසි අධීක්ෂණයක් කිරීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම නිසා 1වන වගඋත්තරකරු සිය වෘත්තීය වගකීම් නිසි පරිදි ඉටු නොකිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බැඳෙන බව මෙයින් නිගමනය කරනු ලැබේ. තවද තමා භාරයේ සිටින සැකකරුවෙකු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් නීතිමය ප්‍රතිපාදන පැවතියද එම නීතිමය ප්‍රතිපාදනයන්ට අනුව 3 වන හා 4 වන වගඋත්තරකරුවන් කටයුතු කර නොමැති බවද මෙයින් නිගමනය කරනු ලැබේ.

මෙවැනි ගැටලුකාරී තතවයන් ඇති නොවීමටත් ඒවා වළක්වා ගැනීමටත් පොලිස් නිලධාරීන් කටයුතු කළ යුතු ආකාරය දක්වමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් **පුද්ගලයන් පොලිස් අත්අඩංගුවේ පසුවන අවස්ථාවකදී හා පොලීසිය සමඟ සිදුවන ගැටුමකදී සිදුවන මරණ වලක්වා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකා පොලීසිය වෙත 2025 අංක 01 දරන පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ නිකුත් කර ඇත. එහි 2 වන වගන්තිය මඟින් රැඳවුම් කාලය තුළ ආරක්ෂාව යටතේ පොලිස් නිලධාරීන් විසින් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව දක්වා ඇත. එහි 2.13 වගන්තිය මඟින් රාජකාරියේ යෙදී සිටින සහ රැඳවියන්ගේ අත්අඩංගුව භාරව සිටින පොලිස් නිලධාරීන් විසින් සෑම රැඳවියෙකුගේම හැසිරීම් සහ චර්යාවන් නිරීක්ෂණය කළ යුතුය යනුවෙන් දක්වා ඇත. තවද 2.4 වගන්තිය මඟින් විශේෂිත අවශ්‍යතා සහිත රැඳවියන්ට විශේෂ වෛද්‍ය ප්‍රතිකාර හා රැකවරණය ලබා දිය යුතුය යනුවෙන් දක්වා ඇත.** එම පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ පිළිබඳ පොලිස් නිලධාරීන්ගේ දැනුවත්භාවය ඇති කිරීමේ වැදගත්කම මෙම සිදුවීම තුළින් ඉස්මතු වේ.

ඉහත සමස්ථ කරුණු සලකා බැලීමේදී පොලිස් නියෝග හා පොලිස්පති චක්‍රලේඛ අනුව ක්‍රියා නොකිරීම මත 3,4 වගඋත්තරකරුවන්ද, පොලිස් ස්ථානයක සැකකරුවන් රඳවා තබා ගැනීමේ හා ඒ සඳහා නිලධාරීන් යෙදවීම සම්බන්ධව මූලික වගකීම් පැවරී ඇති 1වන වගඋත්තරකාර ස්ථානාධිපතිවරයා විසින් එම වගකීම බරපතල ලෙස පැහැරහැර හා නොලසකා හැරීම මඟින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තියෙන් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පොලිස්පතිවරයා වෙත පහත නිර්දේශ කර සිටී,

<u>නිර්දේශ</u>

1. 1,3,4 වගඋත්තරකරුවන් විසින් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව (සැකකාරියට නිසි අධීක්ෂණයක් ලබා දීමට අපොහොසත්වීම) පරීක්ෂාකර ඔවුන්ට එරෙහිව සුදුසු පියවර ගැනීම.

2. මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව ඔවුන් විසින් පොලිස් නිලධාරීන්ගෙන් මත්ද්‍රව්‍ය පානය කිරීමට ඉල්ලා සිටින අවස්ථාවන්හිදී හා ඔවුන් මත්ද්‍රව්‍ය නොමැති වීම මත ඇතිවන අසනීප ස්වභාවයක් නිරීක්ෂණය වන අවස්ථාවන්හිදී එකී සැකකරුවන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීමට හැකිවන පරිදි වැඩපිළිවෙලක් සකස් කර ඒ පිළිබඳ පොලිස් නිලධාරීන්ට උපදෙස් ලබා දීම.

3. සෑම පොලිස් ස්ථානයකම කාන්තා රැඳවියන්ගේ ආරක්ෂාව සඳහා ආරක්ෂක මාතාවක් හෝ පොලිස් නිලධාරිනියක් යෙදවීම අනිවාර්ය කිරීම හා එම ආරක්ෂාක මාතාව සැකකාරියන් ඍජුව අධීක්ෂණය වන පරිදි ස්ථානගත කිරීමට පියවර ගැනීමට උපදෙස් ලබා දීම.

4. පුද්ගලයන් පොලිස් අත්අඩංගුවේ පසුවන අවස්ථාවකදී හා පොලීසිය සමඟ සිදුවන ගැටුමකදී සිදුවන මරණ වලක්වා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා පොලීසිය වෙත යොමු කරනු ලබන 2025 අංක 01 දරන පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ පිළිබඳව පොලිස් නිළධාරීන් දැනුම්වත් කිරීම සඳහා සියලුම පොලිස් ස්ථාන ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2025. 11.12 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා වෙත මෙයින් දන්වා සිටිමු.

**එල්.ටී.බී. දෙහිදෙණිය,**
**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු),**
**සභාපති,**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**නිමල් ජී. පුංචිහේවා,**
**කොමසාරිස්,**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : 01. අමාත්‍යතුමා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
4වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. } දැනගැනීම සඳහා

02. පොලිස්පති
පොලිස් මූලස්ථානය,
කොළඹ 01 } අවශ්‍ය පියවර ගැනීම සඳහා